**ශීර්ෂය 282 වාරිමාර්ග දෙපාර්තමේන්තුව**

**-------------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**--------------**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

**-----------------------------**

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 30 දින ගණන්දීමේ නිළධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූලි 15 දින ගණන්දිමේ නිළධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**--------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**-----------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක  සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය  මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී.  මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව  ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 අත්තිකාරම් ගෙවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 අගෝස්තු 02 දින සේවය හැර ගොස් සිටි මාතලේ ප්‍රාදේශීය කාර්යාලයේ සේවය කළ රියදුරෙකු වෙත වැරදි ලෙස ගෙවා තිබූ වැටුප රු.74,070 ක් මුදලක් ඇතුළුව අයවිය යුතු රු.192,164 ක් අත්තිකාරම් බී ගිණුමේ වැටුප් රහිත නිවාඩු ලැබ විදේශ ගතවූ නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ ලෙස හෙළිදරව්කර තිබුණි. වැරදි සහගත ලෙස වැටුප් ගෙවීම සිදු කළ අයගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වැඩිපුර ගෙවා ඇති වැටුප රු.74,070 ක මුදල ඉදිරියේදී අයකිරීමට කටයුතු කරනු ලැබේ. තවද ආපදා ණය ශේෂය රු.188,414 ක් සහ උත්සව අත්තිකාරම් රු.3,750 ක් ලෙස මුළු ණය ශේෂය රු.192,164 ක් අත්තිකාරම් බී ගිණුමට අයවීමට ඇති අතර එම ණය ශේෂය අතපසුවීමකින් සැසඳුම් ප්‍රකාශයේ වැටුප් රහිත නිවාඩු ලැබ විදේශ ගතවූ නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂයක් ලෙස සටහන් කර ඇත. එම සටහන නිවැරදි කිරීමට කටයුතු කරමි. | වැටුප් ගෙවීම් නිවැරදිව සිදුකල යුතු අතර අත්තිකාරම් ගිණුමට නිවැරදිව සටහන් ඇතුලත් කළ යුතුය. |

### 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

#### 1.6.2.1 මූල්‍ය නොවන වත්කම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ස්ථාවර වත්කම් ගිණුම් ගත කිරීම සම්බන්ධව ලබාදී ඇති උපදෙස් අනුව සංකේත අංක 61414 යටතේ වැව් ජලාශ ඇලවේලි ආදි මූල්‍ය නොවන වත්කම් හදුනාගෙන ගිණුම්ගත කළ යුතු වුවත් 2021 වර්ෂය තුල රු.661,112,174 ක් වැයකර සංවර්ධනය කරන ලද වැව් ජලාශ ඇලවේලි ආදිය නිශ්චිත ලෙස හදුනාගෙන මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය මඟින් ලබා දී ඇති උපදෙස් මඟින් අවසර දී ඇත්තේ 2105 වැය විෂය යටතේ එනම් ඉඩම් හා ඉඩම් වැඩි දියුණු කිරීම් සඳහා දරන වියදම් පමණක් ස්ථාවර වත්කම් ලෙසට ඉන්වෙන්ට්‍රි ගත කරන ලෙසය. නමුත් සඳහන් කර ඇති රු.661,112,175 ක මුදල වෙනත් වැය විෂයන් යටතේ යොදවා ඇත. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබා ගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලැබේ | වැව් ජලාශ ඇලවේලි ආදිය සඳහා දරන ලද ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් නිශ්චිතව හදුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2015 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භ කර 2017 වර්ෂයේ අවසන් කර තිබූ කොන්ත්‍රාත් වටිනාකම රු.185,043,180 ක් වූ ගල්ගමුව වාරිමාර්ග අභ්‍යාස ආයතනයේ නව කාර්යාල ගොඩනැගිල්ල ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි. | දැනට අප දෙපාර්තමේන්තුව මගින් ගිණුම් ගත කර ඇත්තේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කර ලබා දී ඇති අයිතිය තහවුරු කර ගත් ගොඩනැගිලි පමණි. මෙම ගොඩනැගිල්ලේ පිරිවැය හඳුනාගෙන අදාළ මුළු වටිනාකම 2022 වර්ෂයේ ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. | දෙපාර්තමේන්තුවට අයත් දේපළ තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුල මූල්‍ය නොවන වත්කම් අත්පත් කර ගැනීම වෙනුවෙන් රු.5,597,916,828 ක වියදමක් දරා තිබුණු නමුත් භාණ්ඩාගාර සටහන් (SA-82) අනුව වටිනාකම රු.3,684,007,764 ක් විය. ඒ අනුව රු.1,913,909,064 වෙනසක් නිරීක්ෂණය විය. | වෙනසක් නිරීක්ෂණය වී ඇත්තේ යාන් ඔය ව්‍යාපෘතියේ 2021 අප්‍රේල් මාසය දක්වා දැරූ වියදම වන රු.1,024,867,733 ක මුදල හා කළු ගල් ඔය ව්‍යාපෘතියේ 2021 පෙබරවාරි දක්වා දැරූ වියදම වන රු.38,199,520.67 මුදලයි. එම ව්‍යාපෘති වල ගිණුම් ඒකක දෙක 2021 වර්ෂයේදී වසා දමන ලදී. ඒ නිසා 2021 වර්ෂයේ දරන ලද වියදම ආරම්භක ශේෂයක් ලෙස රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි ක්‍රියාකර ඇත. | මූල්‍ය ප්‍රකාශය හා භාණ්ඩාගාර සටහන්වල දත්ත සසඳා නිවැරදි අගය දැන්විය යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසානයේදී දෙපාර්තමේන්තුවේ කලාප අධ්‍යක්ෂ කාර්යාලවල හා ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවල ඉඩම් අක්කර 4,735 පර්චස් 123 ක් හා බණ්ඩාරවෙල, ගාල්ල, නුවර, පොළොන්නරුව, මොනරාගල, හම්බන්තොට වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලවල පිහිටි ගොඩනැගිලි 392 ක් තක්සේරු කර ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | මෙම ඉඩම් හා ගොඩනැගිලි හැකි ඉක්මනින් තක්සේරු කර දෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුවට ලිපි යොමු කර ඇති අතර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අංක SA/GFS/01/01/01 – volume xi හා 2022.05.26 දිනැති ලිපිය මඟින්ද අදාළ දේපල තක්සේරු කරන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත. එම දෙපාර්තමේන්තුව මෙම දේපල තක්සේරු කළ වහාම මෙම ඉඩම් හා ගොඩනැගිලි ගිණුම් ගත කිරීමට නියමිතය. | දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය |
| (ඉ) | ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව මූල්‍ය නොවන වත්කමේ වටිනාකම රු.92,494,173,747 ක් වුවද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ආරම්භක ශේෂය ලෙස රු.95,644,387,556 ක් ලෙස දක්වා තිබුණි. මේ අනුව ආරම්භක ශේෂයේ රු.3,150,213,809 ක වෙනසක් නිරීක්ෂණය විය. ආරම්භක | වැඩිපුර දක්වා ඇති ආරම්භක ශේෂය දැක්වෙන්නේ වර්ෂය තුල වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙනුවෙන් වෙනත් දෙපාර්තමේන්තු සඳහා වියදම් කල රු. 1,063,672,253 තුල දරන ලද ඇතැම් වියදම් වැරදි නිවැරදි කිරීමේදී ආරම්භක ශේෂයන් ලෙස දැක්වීම හේතුකොටගෙන ය. භාණ්ඩාගාර ගිණුම් හා දෙපාර්තමේන්තු පොත් අතර මෙම | දෙපාර්තමේන්තු ගිණුම් හා භාණ්ඩාගාර ගිණුම්වල නිවැරදිව සටහන් තබාගත යුතුය. |

| | |
|---|---|
| ශේෂයට සිදු කරන ලද ගැලපීම් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොවුණි. | ශේෂ අසමානතා සම්බන්ධයෙන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් අප විසින් විමසුම් කළ අතර, 2022 වර්ෂයෙන් පසු මෙම ශේෂ අසමානතා නිවැරදිව සිදුකරන බවට දන්වන ලදී. |

### 1.6.3 අග්‍රිම ශේෂය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවරයකු විසින් සිදුකරන ලද රිය අනතුරක් සම්බන්ධයෙන් වූ නඩු තීන්දු දෙකකට අදාලව වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගෙන් අයකර ගන්නා ලද රු.3,608,100 ක මුදලක් 2021 දෙසැම්බර් 31 දිනට, අදාල විශ්‍රාමික නිලධාරියාගෙන් අයවිය යුතුව තිබූ රු.3,908,000 ක මුදලින් නොපියවූ අග්‍රිම ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ ඉදිරියට ගෙනවිත් තිබුණි. 2018 සිට 2021 දක්වා වර්ෂ 3 ක කාලය තුල එම නිලධාරියාගේ විශ්‍රාම පාරිතෝෂිතයෙන් අයකරගත හැකි ප්‍රමාණය අයකර ගෙන නොතිබුණු අතර ඔහුගේ විශ්‍රාම වැටුපින් මාසිකව රු.10,000 ක් වැනි මුදලක් අයකිරීමට දෙපාර්තමේන්තුව විසින් ගෙන තිබූ තීරණය හේතුවෙන් එම කාලය තුල අයකරගෙන තිබූ මුදල රු.300,000 ක් පමණක් විය. 2021 අගෝස්තු මස අදාල නිලධාරියා මියයාම හේතුකොටගෙන ඉහත නොපියවූ අග්‍රිම ශේෂය අය කර ගත නොහැකිව තිබූ අතර එම ශේෂය කපා හැරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් ගෙන් අනුමැතිය ඉල්ලා තිබුණි. | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් ලබාදුන් උපදෙස් පරිදි අදාල අලාභය කපා හැරීම සඳහා වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම්ගෙන් 2022. ජුනි 09 දිනැති ලිපියෙන් අනුමැතිය ඉල්ලා ඇත. | රජයට අයවිය යුතු මුදල් නියමිත පරිදි අයකර ගතයුතු අතර එසේ සිදු නොකළ නිලධාරීන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය. තවද විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීමට ඇති හැකියාව සොයා බැලීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඇස්තමේන්තු සකස් කිරීමේ දී අවශ්‍යතා හඳුනාගැනීමකින් තොරව වෙන්කිරීම් සිදු කිරීම සහ සැළසුම් කළ පරිදි වැඩ කටයුතු නොකිරීම යන හේතු නිසා රු.14,668,500,000 ක් වූ ශුද්ධ වෙන්කිරීම් වලින් රු.29,30,772,857 ක් ඉතිරි වී තිබුණි. අය වැය ලේඛනය මගින් ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම්, යටිතල පහසුකම් සංවර්ධන වැය විෂයයන් යටතේ සංවර්ධන වැඩ සටහන් 05 ක් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන සම්පූර්ණයෙන් උපයෝජනය කර නොගෙන වෙනත් සංවර්ධන වැඩසටහන් සඳහා 50% කට වැඩි ප්‍රමාණයක් මාරු කර තිබීම නිසා සැලසුම් කර තිබුණු පරිදි එම සංවර්ධන වැඩ සටහන් ඉටු වී නොතිබුණි. | ගංවතුර අවධානම අවම කිරීමේ ව්‍යාපෘතිය 2021 වසර සඳහා සැලසුම් කරන ලද මිලියන 200 ක පමණ වූ ප්‍රතිපාදනයට අදාල වූ කාර්යයන් නිමකර ගැනීමට විවිධ හේතු නිසා නොහැකි විම නිසා මිලියන 1000 ක ප්‍රතිපාදන මාරු කර ඇත. කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිය, වඩමාරච්චි කලපුවේ ජලය සැපයීම ව්‍යාපෘතිය සහා දෙමටගල වැව පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය අදාල මූලික කටයුතු සිදුකිරීම ප්‍රමාදවිම, යෝජිත පෙතියාගොඩ පොම්පාගාරය ඉදිකිරීම සඳහා ප්‍රසම්පාදන කටයුතු 2021 වාර්ෂයේදී අවසන් කිරීමට නොහැකි වීම. අදිය හේතුවිය. | ව්‍යාපෘති සැලසුම් කල පරිදි ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය. |

### 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 255/ 2017 02 ( d) ප්‍රකාරව මුදල් වර්ෂයට අදාළ ගෙවීම් එම මුදල් වර්ෂයේ දී නිදහස් කළ යුතු අතර, කිසිදු බැරකමක් ඊලග වර්ෂය තුළ නිරවුල් කිරීමේ අරමුණ ඇතිව ඉදිරියට ගෙන නොයා යුතු බවට ලබා දී තිබූ උපදෙස්වලට පටහැනිව ඇතිකර ගන්නා වගකීම් නිරවුල් කිරීම සඳහා භාණ්ඩාගාර තවදුරටත් කටයුතු කරනු නොලබන බවටත් උපදෙස් දී තිබියදී 2021 දෙසැම්බර් 31 දිනට රු.1,689,409,606 ක බැරකම් නිරීක්ෂණය විය. | 2021.12.31 දිනට මූල්‍ය වාර්තාවේ දක්වා ඇති රු.1,689,409,606 බැරකමක් දක්වා ඇත්තේ අක්මුදල් නොමැති වීම නිසාය. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 255/ 2017 ට අනුකූල ලෙස බැරකම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය |

## 2.3 තැන්පතු

පහත සඳහාන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විවිධ ව්‍යාපෘතීන් ඉටුකිරීම සඳහා දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබුණු රු.4,194,430 ක මුදල අදාල කාර්යයන් සඳහා යොදවා නොගෙන වර්ෂ ගණනාවක සිට තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | 2021 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලයට අයත් රු. 47,900 ක මුද්දර ගාස්තු ත්‍රිකුණාමලය කලාපයට අදාල වන අතර මේ වන විට අදාල දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලයේ සේවකයෙකු 2020 දෙසැම්බර් මස ආපදා ණය ශේෂය නිරවුල් කිරීම සඳහා ගෙවන ලද රු.155,207ක් අත්තිකාරම් බී ගිණුමට බැරකරනු වෙනුවට තැන්පත් ගිණුමට සටහන් කර තිබුණි. | අදහස් දක්වා නැත. | නිවැරදි ගිණුමට සටහන් කිරිමට කටයුතු කල යුතුය |

## 2.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී විසින් දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | දක්වා ඇති අදහස් ඡේදයේ කරුණුවලට අදාල නොවේ. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අදාළ සමාලෝචන රැස්වීම් වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් ක ල යුතුය. |

## 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වු නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) 1946 අංක 32 දරන වාරිමාර්ග ආඥා පනතේ 285 වැනි පරිච්ඡේදයේ 64 වැනි වගන්තිය | වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ප්‍රධාන හා මධ්‍ය පරිමාණ ජල යෝජනා ක්‍රම ප්‍රධාන ගංගා ද්‍රෝණි ජලපෝෂක හා රක්ෂිතයන්හි ආරක්ෂාව, අනවසර ඉදිකිරීම් හා වගා කටයුතු පාලනය, ජලය අපවිත්‍ර කිරීමෙන් වලක්වා ගැනීම, අනවසරයෙන් ජල භාවිතා කිරීම පාලනය කිරීම වාරිමාර්ග යෝජනා ක්‍රමයන්හි නඩත්තුව සම්බන්ධ විධිමත් නියාමනයක් සිදුකිරීමට අවශ්‍ය නිර්ණායක නිකුත්කර නොතිබුණි. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ප්‍රධාන හා මධ්‍ය පරිමාන ජල යෝජනා ක්‍රම, ප්‍රධාන ගංගා ද්‍රෝණි , ජලපෝෂක හා රක්ෂිතයන්හි ආරක්ෂාව සඳහා ගංගාධාර කළමනාකරණ අංශය ගංගාවන් මිනුම්කොට ගඟෙහි ව්‍යුහය සහ සම්බන්ධ දත්ත රැස් කිරීම හා රක්ෂිත පරීක්ෂා කර දත්ත රැස් කිරීම හා ප්‍රකාශයට පත් කිරීම, ගංගා අපවිත්‍ර වීමට හේතුවන ප්ලාස්ටික් , පොලිතීන් ආදී ඝන අප ද්‍රව්‍ය ඉවත් කිරීම, ගංගා දූෂණයට හේතුවන කාරණා සොයා නිවැරදි කිරීම පිණිස අදාල ආයතන දැනුවත් කිරීම, ජල දූෂණයට ලක්වූ ගංගාවන් වල සැබෑ තත්ත්වයන් එළිදරව් කරමින් හා නිවැරදි විය යුතු අයුරු පැහැදිලි කිරීම පිණිස කෙටි චිත්‍රපට සකස් කර අදාල ප්‍රජාව, නිලධාරීන් හා දේශපාලන අධිකාරිය දැනුවත් කිරීම සිදු කර ඇත. | ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) 2017 ජූලි 18 දිනැති අංක අමප/17/1456/729/017 දරන අමාත්‍ය මණ්ඩල තීරණය | ගල්ගමුව වාරිමාර්ග අභ්‍යාස ආයතනයේ ජාත්‍යන්තර මට්ටමේ පුහුණු පාඨමාලා හා වැඩමුළු පැවැත්වීම සඳහා 2017 වර්ෂයේ දී අනුමැතිය ලබා ගෙන තිබූ නමුත් පසුගිය වසර 05 තුලම | තායිලන්තයේ රජමංගල විශ්ව විද්‍යාලය සමග එක්ව ජාත්‍යන්තර පුහුණු පාඨමාලාවක් 2019 ජුනි මස පවත්වන ලදි 2019.06.17 දිනැති අයවැය චක්‍රලේඛ අංක 4/2019 මගින් දේශීය අරමුදල් මගින් වියදම් දරමින් | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ජාත්‍යන්තර මට්ටමේ පුහුණු පාඨමාලා කිසිවක් පවත්වා නොතිබුණි. | සම්මන්ත්‍රණ/වැඩමුළු ආදිය නැවැත්වීම නිසා ජාත්‍යන්තර වැඩසටහන් පවත්වා නොමැත. | |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4.4 සහ 4.5 වගන්ති | මිය ගිය නිලධාරීන් විසිතුන් දෙනෙකුගෙන් අයවිය යුතු රු.2,751,438 ක්, විශ්‍රාම ගොස් තිබූ සේවකයන් 83 දෙනෙකුගෙන් අයවිය යුතු රු.9,013,134 ක් සහ වැඩ තහනමට ලක්වූ නිලධාරීන්ගෙන්, සේවය හැර ගිය නිලධාරීන්ගෙන් හා සේවය අත්හිට වූ නිලධාරීන්ගෙන් අය විය යුතු රු.2,522,087 ක් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම ශේෂයන් තුල වර්ෂ තුනකට වඩා පැරණි රු.2,521,332 ණය ශේෂයක් හා අවුරුදු පහකට වැඩි රු.1,294,985 ක ණය ශේෂයක් විය. | තවදුරටත් අයවිය යුතු ණය ශේෂ අයකර ගැනීමට ක්‍රියාකරමින් පවතී . | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය |
| (ඇ) | 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් දක්වා තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබාදීමට ගණන්දීමේ නිලධාරියෙකුට හැකිය. 2021 ජනවාරි සිට ජුලි දක්වා කාල සීමාව තුල අවස්ථා 12 ක දී රු.100,000 බැගින් අත්තිකාරම් මුදල් ලබා දී තිබුණු අතර ඒ සියළු අවස්ථාවලදී අත්තිකාරම් මුදල ඉක්මවා රු. 118,838 වියදම් කර තිබුණි. | මගේ අංක CFO/FIN/001/2021 හා 2021.02.24 දිනැති මු.රෙ.135 බලතල බෙදීම අනුව වාරිමාර්ග අධ්‍යක්ෂවරුන් වෙත රු.100,000. අත්තිකාරම් ලබා දීමට බලතල පවරා ඇත. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**2.6 අවිධිමත් ගනුදෙනු**

-------------------

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගල්ගමුව පුහුණු අභ්‍යාස ආයතනයේ මුළුතැන්ගෙයි අරක්කැමි තනතුර සඳහා බඳවාගෙන තිබුණු අනියම් කම්කරුවන් දෙදෙනෙකුට 2021 වර්ෂයේ වැටුප් ගෙවීම සඳහා 2021 ජනවාරි 29 දින රු.1,000,000 ක ප්‍රතිපාදන නිදහස් කර තිබුණි. එමගින් වැටුප් ගෙවීම් කර තිබූ නමුත් පුහුණු පාඨමාලාවන්ට අදාළ ඇස්තමේන්තු සකස් කිරීමේදී එක් අරක්කැමියෙකුට දෛනිකව වැටුප් ලෙස රු.1,850 බැගින් අරක්කැමියන් දෙදෙනෙකු සඳහා එම වැඩසටහන් පැවැත් වූ දින ගණන අනුව වැටුප් ඇතුලත් කර මුදල් ලබාගෙන තිබූ අතර එම මුදල් ද වැයකර තිබුණි. දෙපාර්තමේන්තුව විසින් සේවක වැටුප් හා අතිකාල දීමනා ගෙවීම් කර තිබියදී වැඩමුළුවලට සම්බන්ධ වූ නිලධාරීන්, රියදුරන්, උදවුකරුවන්, මුළුතැන්ගෙයි සේවකයන්, කාර්යාල කාර්යය සහයකයින්ගේ අතිකාල වෙනුවෙන් වූ වටිනාකම් ද ඇස්තමේන්තුවට ඇතුලත් කර මුදල් ලබාගෙන තිබුණි. | අනුමත කාර්යය මණ්ඩලයේ අරක්කැමි තනතුර නොමැති බැවින් අනියම් පුහුණු කම්කරුවන් එම කාර්යය සඳහා බඳවා ගෙන ඇත. දින 05 කට හෝ ඊට වැඩි කාලයක් තුල එක දිගට පැවැත්වෙන පුහුණු වැඩසටහනක් සඳහා උදේ දිවා රාත්‍රි ආහාර සැපයීමේදී, එම වැඩසටහන පැවැත්වෙන කාලය තුල පමණක් අරක්කැමි රාජකාරි සඳහා අතිරේක පුහුණු ශ්‍රමිකයන් දෛනික වෙතන ගෙවීමේ පදනම මත සේවයේ යොදවනු ලබන අතර ,එම කම්කරු වැටුප්, ආයතනයේ සේවයේ යෙදෙන නිලධාරීන්, රියදුරන්, උදවුකරුවන්, මුලුතැන්ගෙයි සේවකයන්, කාර්යාල කාර්යය සහයකයන්ගේ අතිකාල දීමනා ගෙවීම් සඳහා ප්‍රතිපාදන සලසා නොමැති බැවින් පුහුණු පාඨමාලාවේ ඇස්තමේන්තුවට ඇතුලත් කරනු ලැබේ. | මුදල් රෙගුලාසි 128 විධිවිධාන වලට අනුකූලව ගණන්දීමේ නිලධාරි කටයුතු කල යුතුය. |
| (ආ) | ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය අනුව අභ්‍යාස ආයතනයට අනුයුක්තව පූර්ණ කාලීනව සේවය කරන අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ඉංජිනේරුවරුන්ට හා ඉංජිනේරු සහකාරවරුන්ට වෙනත් කිසිදු දීමනාවක් නොගෙවීමේ පදනම මත ඔවුන්ගේ දීමනා රහිත මාසික වැටුපෙන් සියයට 20 දීමනාවක් ගෙවීම සඳහා අධ්‍යක්ෂ විසින් 2011 ජනවාරි 04 දින අනුමතිය ලබාදී | පිළිගනිමි. 2022 පෙබරවාරි මස සිට අදාල ගෙවීම් නතර කර ඇති අතර, ඒ සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. | ආයතන අධ්‍යක්ෂක ජනරාල්ගේ අනුමැතියකින් තොරව දීමනා ගෙවීම් නොකළ යුතුය. අනුමැතියකින් තොරව ගෙවන ලද දීමනා අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

තිබුණි. ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ අනුමතියකින් තොරව දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වර්ෂ 05 ක කාලය තුල රු.5,273,189 ක් වූ අධ්‍යයන දීමනා ගෙවා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 අපේක්ෂිත ප්‍රතිලභ ලබා නොගැනිම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) යාන් ඔය ජලාශය ඉදි කිරිම හේතුවෙන් අහිමි වූ වනාන්තර වෙනුවෙන් නැවත වන වගා කිරීම සඳහා අනුරාධපුර දිසා වන කාර්යාලයට රු.12,000,000 ක් ලබා දී තිබුණි. ඒ අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ හෙක්ටයාර 209.1 ක පැල 200000 ක් රෝපණය කල බවට වාර්තා කර තිබුණද පැල ලක්ෂයක් පමණක් වගාකර තිබුණි. ජලාශයේ FSL හා HFL මට්ටම අතර පිහිටි ඉඩම්වල යෝග්‍යතාවය පිලිබඳ ඇගයිමකින් තොරව පැල සිටුවිම නිසාත් ව්‍යාපෘති පාරිසරික වාර්තාවේ බලපෑම තක්සේරු අවශ්‍යතාවයන්ට අනුකුලව වන වගා කටයුතු සිදු නොකිරීම නිසාත්, ජලාශය පිරිමේදී එම ප්‍රදේශ ජලයෙන් යටවිම හේතුවෙන් සිටුවන ලද පැල වලින් සියයට 90 කට වැඩ ප්‍රමාණයක් විනාශ වී තිබුණි. | අනුරාධපුර දිසාවන කාර්යාලය වෙත ලබාදෙන මුදලින් වන වගාව සඳහා පැල නිශ්පාදනයට යාන් ඔය ජලාහය අසලම භූමියක් වෙන් කර වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් පැල තවාන් ස්ථාපිත කර පැල 110,000 ක් නිපදවා ඇත.<br><br>මෙහිදී යාන් ඔය ජලාශය අසල තවානේ නිපදවූ පැල 100,000 අධි වර්ෂාවත් සමඟ මෙම පැල සිටවූ ප්‍රදේශය ජලයෙන් යට වීම, සති 02 ක් පමණ කාලයක් ජලය රැදී තිබීම. ගවයන් තණ කෑම සඳහා නිරන්තරයෙන් මෙම ප්‍රදේශවලට යොමු කිරීම, වන වගාව සාර්ථක කර ගැනීම සඳහා වර්ෂ 03 ක අත්‍යාවශ්‍ය නඩත්තු කටයුතු සඳහා ප්‍රතිපාදන ව්‍යාපෘතියෙන් ලබා දීමට නොහැකි වීම ආදියහේතු විය. | පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවේ නිර්නායකයන් සැලකිල්ලට නොගෙන නොසැලකිලිමත් ලෙස කටයුතු කල නිලධාරින් සම්බන්ධයෙන් විනයානුකුලව කටයුතු කල යුතුය. |

**3.1.2 ව්‍යාපෘති නිම නොකර අතහැර දැමීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වඩමාරච්චි කලපුවෙහි ජල සම්පත් සංවර්ධනය කිරිම මගින් යාපනය අර්ධද්වීපයේ ජනතාවට පානීය ජලය සැපයීම සඳහා 2019 වර්ෂයේදී දේශීය අරමුදල් රු.මිලියන 2,000 ක ඇස්තමේන්තු පිරිවැයක් යටතේ ආරම්භ කර එම වර්ෂයේදී අවසන් කිරීමට නියමිතව තිබුණද 2021 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 28 ක් වැයකර තිබුණු අතර ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. | මෙම ව්‍යාපෘතිය සඳහා මේ වන තුරුම අනුමැතිය නොලැබුණි.<br><br>මෙවැනි ව්‍යාපෘතියක් ශ්‍රී ලංකාවේ මීට පෙර ක්‍රියාත්මක කර නොමැති බැවින්, මේ සියළු ගැටලු ඇතුළත් වාර්තාවක් වාරිමාර්ග අමාත්‍යංශයේ ලේකම්වරයා වෙත වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් අංක :C&D/DI (RD)/PWSPJP-1 හා 07-06-2021 දිනැති ලිපයෙන් දන්වා මෙම ව්‍යාපෘතිය තවදුරටත් කරගෙන යාමට වාරිමාර්ග දෙපාර්තමේන්තුවට නොහැකි බව දන්වන ලදී. | ව්‍යාපෘතිය ආරම්භ කිරිමට ප්‍රථම පාරිසරික බලපෑම් තක්සේරු හා ශක්‍යතා අධ්‍යයනයන් සිදු කර අදාළ රේඛීය ආයතනයන්ගෙන් අවශ්‍ය අනුමැතීන් ලබා ගත යුතුය. |

**3.1.3 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) බෙන්තර ගඟ දකුණු ඉවුරු ජලාපවාහන කරදිය වැලක්වීමේ ව්‍යාපෘතිය මූලික සැලැස්ම අනුව රු.මිලියන 298 ක දේශීය අරමුදලින් 2015 වාර්ෂයේ දී ආරම්භ කර 2017 වර්ෂයේ දී අවසන් කිරීමට නියමිතව තිබුණු අතර පසුව 2021 වර්ෂයේදී අවසන් කිරීම සඳහා කාලය දීර්ඝ කර තිබුණි. 2015 සිට 2020 දෙසැම්බර් 31 දක්වා ව්‍යාපෘතිය සඳහා රු.මි. 95,194 ක් වැයකර තිබුණු අතර 2021 | මෙම ඉදිකිරීම් සඳහා ඇස්මේන්තු සකස් කරන කාලයේ දී පැවති මිල ගණන් යටතේ පස් සපයා ගැනීමට නොහැකි වු අතර ප්‍රවාහනය පිළිබඳව ගැටළු මතුවිය. මෙම වෙලි ගොහොරු බිම් මතින් ඉදිකළ යුතු බැවින් අවශ්‍ය සම්මත පසුතැලීම් පිළිබද නිර්නායකයන් ලබා ගැනීමට ද ගැටළුවක් විය. එම නිසා ගෙවීම් කිරීමට ද ප්‍රමාද විය. ගොවිබිම්වල | ව්‍යාව්‍යාපෘතිය ආරම්භ කිරීමට ප්‍රථම පාරිසරික බලපෑම් තක්සේරු හා ශක්‍යතා අධ්‍යයනයන් සිදු කර අදාළ රේඛීය ආයතනයන්ගෙන් අවශ්‍ය අනුමැතීන් ලබා ගත යුතු අතර සැලසුම් කල කාලය තුල වැඩ නිම කිරීමට කටයුතු කළ |

| | | | |
|---|---|---|---|
| | වර්ෂයේදී රු.මිලියන 100 ක් ලැබී තිබුණි. එම මුදලින් රු.මිලියන 69.950 ක් වැයකර තිබුණු අතර රු.මිලියන 30.050 ක් ඉතිරි වී තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා 2015 වර්ෂයේ සිට 2021 දක්වා රු. මිලියන 165,144 ක් වැයකර තිබුණි. ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය සියයට 55 ක් වුවත් භෞතික ප්‍රගතිය සියයට 35 ක් පමණක් විය. | ප්‍රධාන ඇල මාර්ග නීතිවිරෝධි ලෙස ආක්‍රමණය කරමින් වගාවන් සිදු කිරීම නිසා එම ගැටළු විසදාගන්නා තෙක් ඉදිකිරීම් කටයුතු නවතා දැමීමට සිදුවිය. | යුතුය. |
| (ආ) | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක ගම්පහ අත්තනගල්ල සහ මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 3,800 ක් බස්නාගොඩ ජලාශය ඉදිකිරීම සඳහා වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2016 මාර්තු 21 දින අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. ඒ අනුව ගිවිසුම අත්සන් කර වර්ෂ 03 කට වැඩි කාලයක් ගතව තිබුණද ව්‍යාපෘතියේ ඉදිකිරීම ආරම්භ කර නොතිබුණි. 2020 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 560 ක් වැයකර ව්‍යාපෘතියේ ජලනල එතීම හා අනෙකුත් කටයුතුවලින් සියයට 33 ක් පමණක් නිම කොට පැවතුණි. ජල මූලාශ්‍ර ඉදිකිරීම ප්‍රමාදවීම හේතුවෙන් එම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට 2021 දෙසැම්බර් 31 දින දක්වාම නොහැකි වී තිබුණි. ව්‍යාපෘතියට කාර්ය මණ්ඩලය 27 ක් අනුමත කරගෙන තිබුණු අතර 18 දෙනෙකු බඳවාගෙන තිබුණි. 2019 ජූනි මස ජලාශයේ ඉදකිරීම් කටයුතු චීන සමාගමක් වෙත පවරා තිබුණද, කාර්ය මණ්ඩල අවශ්‍යතාවය පිළිබද සමාලෝචනයකින් තොරව ව්‍යාපෘති කාර්යාලය පවත්වාගෙන ගොස් තිබුණි. | මෙම ව්‍යාපෘතිය වාරිමාර්ග අමාත්‍යංශය හා ජාතික ජල සම්පාදන පවාහන මණ්ඩලයේ එකඟතාවය මත 2019 ජූනි මස EPC (ඉංජිනේරුමය, ප්‍රසම්පාදන හා ඉදිකිරීම්) කොන්ත්‍රාත් ක්‍රමය යටතේ ගිවිසුමක් වාරිමාර්ග අමාත්‍යංශයේ ලේකම්වරයා හා Sinohydro Corporation Limited අතර 2019 ජූනි මස 13 වන දින අත්සන් කර ඇත. ඒ අනුව Sinohydro Corporation Limited සමාගම මෙම ව්‍යාපෘතිය සඳහා විමර්ශන කටයුතු සැළසුම් කටයුතු, ක්‍රම සැළසුම් කටයුතු නිම කර ජලාශයේ අත්තිවාරමේ ඉදිකිරීම් කටයුතු පිවිසුම් මාර්ගවල ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී. අනෙකුත් සියළුම ව්‍යාපෘතිවලට බලපාන අයුරින් මෙම ව්‍යාපෘතියට ද කොවිඩ් 19 වසංගතයේ බලපෑම්, ඉන්ධන හා අමුද්‍රව්‍ය වල හිගකම බලපා ඇත. සැලසුම් වෙනස් කිරිමට සිදුවිම. කාර්යමණ්ඩලය බඳවාගැනීම් ප්‍රමාදවිම, ඉඩම් අත්පත් කර ගැනිම් ප්‍රමාද විම, තක්සේරු වාර්තා ලබා ගැනිමට ප්‍රමාදවිම, මහජන විරෝධතා ඇතිවිම ආදිය හේතු විය. කාර්යමණ්ඩලය විසින් මිනුම් ගැනිම,පාලන ලක්ෂ පිටාර මට්ටම් ලකුණුකිරිම, ඉදිකිරිම් හා සම්බන්ධිකරණ කටයුතු අධික්ෂණය සිදුකරනු ලබයි. | එළඹී ඇති ගිවිසුම් ප්‍රකාරව නියමිත කාලය තුල ව්‍යාපෘතිය නිම කිරීම සඳහා කටයුතු කළ යුතු අතර කාර්යය මණ්ඩලය පිළිබඳව සමාලෝචනය කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වාරි සෞභාග්‍යා ව්‍යාපෘතිය යටතේ වැව් වැඩිදියුණු කිරීම - 2021** | | |
| i | වැව් 16 හි රොන්මඩ ඉවත් කර තිබුණද සමහර වැව් වල රොන්මඩ වැව් පතුලේම ගොඩගසා තිබුණු අතර වර්ෂාවට පෙර රොන්මඩ ඉවත් නොකිරීම හේතුවෙන් නැවත වැවට එකතු වී තිබුණි. ඒ අනුව වැය කල මුදල් නිශ්ක්‍රීය වියදමක් වී තිබුණි. 1/2021 දරන රාජ්‍ය අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව ඉවත් කළ රොන්මඩ හා පස් වෙන්දේසි කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම කාර්යය නිම කිරීමට ප්‍රථම වර්ෂාව පැමිණි බැවින් යන්ත්‍රෝපකරණ ඒ වෙත ගෙන යාමට නොහැකි වීම නිසා ඉවත් කිරීමට නොහැකි වී ඇත. ඉදිරි ජූලි, අගෝස්තු මාසවල එය ඉවත් කිරීමට කටයුතු යොදා ඇති බව දන්වා ඇත. වර්ෂාව නිසා ගොඩගැසූ පස්වලින් කිසියම් සුළු ප්‍රමාණයක් සේදී යයි. | වැව් වල රොන්මඩ ඉවත් කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටීන් සකස් කළ යුතු අතර පස් විකිණීමේදි රාජ්‍ය භාගය හා ඉඩම් පරිහරණ ගාස්තු අය කල යුතුය. |
| ii. | ව්‍යාපෘතියට අවශ්‍ය වැලි හා කළුගල් රු.18,201,825 ක මිලදීගෙන තිබුණු අතර කුරුණෑගල දිස්ත්‍රික් සම්මත අනුමත මිලගණන් වලට වඩා මිලදී ගෙන තිබූ මිළගණන් රු 1,500 සිට 7,500 අතර වෙනසක් පැවතුණි. මේ අනුව සම්මත මිලගණන් වලට වඩා රු.7,830,200 ක් වැය වී තිබුණි. තවද සාමාන්‍ය වෙළඳපොල මිලට මිලදී ගැනීමට කටයුතු කලේ නම් වැලි හා කළුගල් මිලදී ගැනීම තුලින් රු.2,480,205 ක් ඉතිරි කර ගත හැකිව තිබුණි. | වයඹ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 20mm, 40 mm පිළිවෙලින් රු.9,100 හා රු 8,100 මිලගණන් අනුමත කර ඇත්තේ ප්‍රවාහන ගාස්තු රහිතවයි. නිකවැරටිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය රැ.13,000 කට ලබාගෙන ඇත්තේ වැඩබිමට සැපයුම් ගාස්තුවද ඇතුළත්වය. ඉහත සඳහන් ද්‍රව්‍ය වල විශාල භිගයක්ව පැවති බැවින් සපයා තිබූ මිලගණන්වලට කියුබ් එකක් අදාල ක්ෂේත්‍රයට ගල් වලවල් හා වැලි ගබඩා කර ඇති ස්ථානයේ සිට ප්‍රවාහනය කිරිම සඳහා යන වියදමද එකතු විය යුතුය. | ඇස්තමේන්තු අනුමත කිරිමට පෙර මිළ ගණන් වල නිවැරදි භාවය තහවුරු කර ගත යුතුය. විධිමත් පරික්ෂණයක් සිදු කර අතිරික්ත ගෙවීම් අයකර ගැනිමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| iii. | යන්ත්‍රානුසාරයෙන් සිදුකරන ලද වැව් බැම්වල පස් පිරවීමට අදාල මිනිස් ශ්‍රමය පදනම් කරගෙන ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් රු.13,120,788 ක අධි ඇස්තමේන්තුවක් සිදු කර තිබුණි. | වැව් බැම්මේ කට්ටි කැපීම හා පස් පිරවිම මිනිස් ශ්‍රමයෙන් සිදු කරන ලෙස වැඩ විස්තරයේ සඳහන් වුවද ඊට අදාලව සන මීටරයක් සඳහා වන රු.16.31 ක මිලගණන් සකස් කර ඇත්තේ මිනිස් ශ්‍රමයෙන් සන මීටරයක් කපා යන්ත්‍රානුසාරයෙන් එම සන මීටරය වතුර දමා තැලීම සඳහාය. ඒ බව සැළසුම් ශිල්පි විසින් සකස් කරන ලද මිළ ගණන් විස්තරයේ තහවුරු වේ. | - එම - |
| iv. | වැව්වලට අදාල අමුණු කොන්ක්‍රීට් කිරීම නාන පඩි, පිටවාන්, පාලම් ඉදිකිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය ප්‍රමිතියෙන් තොර වීම, ඉදිකිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව සතු වාහන, යන්ත්‍රසූත්‍ර කාර්ය මණ්ඩලය හා ශ්‍රමිකයන් ප්‍රමානවත් පරිදි සැලසුම් නොකිරීම, සංවර්ධන කටයුතු හේතුවෙන් අධික වර්ෂා කාළවලදී සිදු කිරීම, තත්ව පාලන පරික්ෂාවන් සිදු කර නොතිබීම, ඇබෝගම වැව් සංවර්ධනය යටතේ රු.7,674,975 ක් වැය කර ඉදිකිරීමට නියමිත පාලම් 2 ක් ඉදිනොකිරීම හේතුවෙන් වැඩ බිමෙහි තිබූ කම්බි අනාරක්ෂිතව තිබීම, උගුරුස්සාව වැව් බැම්ම නිසි පරිදි සංගත වී නොතිබීම හේතුවෙන් වැඩ බිම තුලට ජලය ගමන් කිරීම, තත්ව පාලනය සඳහා රු.2,078,088 ක් වෙන් කර තිබුණද නිසි තත්ව පාලන පරික්ෂාවන් සිදු නොකිරීම, ආදී අඩුපාඩු නිරීක්ෂණය විය. | ඉදිකිරීම් කටයුතු කිරීමේදී පවතින කාළගුණික තත්ව වලට මුහුණ දීමට සිදුවීම සාමාන්‍ය කරුණක් වන අතර මොනයම්ම තත්වයක් යටතේ වුවද ප්‍රමිතියට අනුව කටයුතු කර ඇති බව දන්වා ඇත. මේ සඳහා සිවිල් ඉංජිනේරු තත්ව පරීක්ෂකගේ තත්ව වාර්තා මගින් තහවුරු වි ඇත. ඇඹෝගම වැවට අදාළ පාලම් 02 න් එකක් මේ වන විට ඉදිකිරීම් අවසන්ව ඇති අතර අනෙක් පාලමේ වැඩ කටයුතු සිදුවෙමින් පවතී.<br><br>මෙය උගුරුස්සාව වැව් බැම්ම වැඩ කරන ලද අවස්ථාවේදී විගණන නිලධාරීන් විසින් කරන ලද විමසුමක් වන අතර මේ වන විට මෙය සම්පූර්ණ කර ඇත | අමු ද්‍රව්‍ය ශ්‍රමය යනාදිය පිලිබදව. තත්ත්ව පරික්ෂාව තත්ත්ව පාලනය වාර්තා තබා ගත යුතු අතර ක්ෂේත්‍ර ආවරණය වන පරිදි කොන්ත්‍රාත් පරිපාලනය පිලිබදව පටිපාටින් සකස් කල යුතුය. |
| v. | වැව් ප්‍රතිසංස්කරණය සඳහා හරස්කඩ මිනුම් ගැනීම වැඩ ආරම්භ කිරීමට ප්‍රථම සිදු කල යුතු වුවත් වැඩ නිම වූ පසු සිදුකිරීම, වැව් වලට අදාල මිනුම් ගැනීම, සැලසුම් කිරීම වාරිමාර්ග ඉංජිනේරුවරයාගේ අධීක්ෂණයට ලක් නොවීම, සියලු ඉදිකිරීම් දෙපාර්තමේන්තු අනුමත ප්‍රමිතීන්ට | උගුරුස්සාව වැව, ඇඹෝගම වැව, මොරගස් වැව/නාගොල්ලාගම, කිණිපිටිය වැව යන වැව් සඳහා ඉංජිනේරු පස් පරීක්ෂකවරුන් එම පරීක්ෂාවන් සිදුකර උපදෙස් දුන් නමුත් කොරෝනා වසංගතය හේතුවෙන් ඉතිරි වැව් සඳහා මෙම නිළධාරීන්ගේ | වැව් ප්‍රතිසංස්කරණය සැලසුම් කල පරිදි සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| අනුව සිදුකිරීම සඳහා හැකි සෑම විටම සිවිල් ඉංජිනේරු ද්‍රව්‍ය සමීක්ෂකගේ සේවය ලබාගත යුතු වුවත් වැව් 16 න් එක් වැවක් සඳහා පමණක් එම සේවය ලබාගැනීම, පරීක්ෂණ ඛණ්ඩයක් (Test Section) පරික්ෂා කර අනුමත ප්‍රමිතීන්ට අදාල ද යන්න සිදුකළ යුතු ක්‍රමවේදය පිළිපැදීම දැක්විය යුතු වුවත් වැව් 16 සඳහාම එසේ සිදු කරනොතිබිම, ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු සිදු නොකිරීම, ඉදිකිරීම් ද්‍රව්‍යලට අදාල ප්‍රමිතිය පරික්ෂා නොකිරීම, අමුණු ගේට්ටු මිලදී ගැනීම හා බොරළු මිලදී ගැනීම සඳහා පිළිවෙලින් රු.2,375,000 ක් හා රු.8,895,00 ක් වැය කර තිබුණද ඊට අදාල තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තා හා නියමිත ප්‍රමිතියට අදාලද යන්න පරික්ෂා කර නොතිබීම යන අඩුපාඩු නිරීක්ෂණය විය. | පැමිණීම නිසිපරිදි සිදුනොවුනත් වාරිමාර්ග ඉංජිනේරුගේ සහ ඉංජිනේරු සහකාරවරුන්ගේ පලපුරුද්ද මෙවැනි කුඩා පරිමාණ වැවක් සඳහා තීරණ ගැනීමට ප්‍රමාණවත් වේ. ඒ අනුව කොට්ඨාස වාරිමාර්ග ඉංජිනේරුගේ උපදෙස් පරිදි මෙම පස් පිළිබඳව අවශ්‍ය උපදෙස් මත ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකර ඇත. කොරෝනා වසංගතයෙන් පසුව මෙම ඉදිකිරීම්වල තත්වය ඉංජිනේරු පස් පරීක්ෂක වරුන් විසින් පරීක්ෂා කර බලා තත්ව සමීක්ෂණ වාර්තාවක් ලබා දී ඇත. |

## 3.3. ප්‍රසම්පාදනය
-------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2021 වර්ෂය තුළ ඉංජිනේරු කාර්යාල 52 මගින් ක්‍රියාත්මක කරන ලද කර්මාන්ත හා නඩත්තු වැඩ සම්බන්ධයෙන් විගණනයට කැඳවන ලද තොරතුරු සඳහා කලාප කාර්යාල 09 කට අයත් ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 31 ක් මඟින් පමණක් තොරතුරු ඉදිරිපත් කර තිබුණි. ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය 31 මඟින් රු. මිලියන 6,839 ක වටිනාකමකින් යුත් කර්මාන්ත 1421 ක් ක්‍රියාත්මක කර තිබුණි. එම කර්මාන්ත අතරින් රු.මිලියන 4,077.49ක් වටිනාකමින් යුත් කර්මාන්ත 755 ස්වකීය සේවකයින් හා උපකරණ භාවිත කර ඉටු කරන ප්‍රසම්පාදන ක්‍රමය (Force Account) යටතේ ක්‍රියාත්මක කර තිබුණි. එම ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් පහත | විවිධ ප්‍රායෝගික ගැටලු හේතුවෙන් ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල වල රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇතැම් වගන්ති අනුගමනය කිරිම මග හැරී ඇත. ඒ අනුව මින් ඉදිරියට සියලුම ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලවල සිදුකරන ඉදිකිරිම් හා නඩත්තු වැඩ සිදුකිරීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය කිරිම අනිවාර්ය බව සියලුම කලාප වාරිමාර්ග අධ්‍යක්ෂවරුන් දැනුවත් කිරිමට කටයුතු කරන බව දන්වමි.වාරිමාර්ග දෙපාර්තමේන්තු සියලු මෙහෙයුම් හා නඩත්තු කටයුතු සිදු කරනු ලබන්නේ | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානයන් ප්‍රකාරව කටයුතු කල යුතුය. |

සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1 හා 4.2 වගන්තිය අනුව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර යාවත්කාලීන කළ යුතු අතර ඒ තුළ ප්‍රසම්පාදන ක්‍රමය නිශ්චය කළ යුතු බවත් 4.2.3(ඇ) වගන්තියට අනුව ප්‍රසම්පාදන කාල සටහන අදාල ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කළ යුතුවුවත් ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 31 මඟින් සමාලෝචිත වර්ෂය තුල සිදු කරන ලද රු.මිලියන 6,839.87 ක වටිනාකමින් යුත් ඉදිකිරීම් හා නඩත්තු කර්මාන්ත 1421 ක ප්‍රසම්පාදන ක්‍රමවේදය ප්‍රදේශීය වාරිමාර්ග ඉංජිනේරු වරයා විසින් නිශ්චය කර තිබුණි.

**(ආ)** ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 4.3.2 වගන්තියට අනුකූල නොවන ලෙස ඇස්තමේන්තු පිළියෙල කිරීම නිසා 2021 වර්ෂය තුළ සිදු කරන ලද රු. මිලියන 6,839.87 ක් වටිනාකමින් යුත් ඉදිකිරීම් හා නඩත්තු වැඩ 1421 ක කරන ලද අධීක්ෂණ හා පරිපාලන පිරිවැය අධි ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 154.88 ක් විය.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.7 ඡේදයෙහි විධිවිධාන කෙරෙහි අවධානය යොමු නොකර, වටිනාකම රු.මිලියන 4,077.49 ක කර්මාන්ත 755 ක් ස්වකීය සේවකයින් හා උපකරණ භාවිතා කර ඉටුකරන ප්‍රසම්පාදන ක්‍රමය (Force Account) යටතේ ක්‍රියාත්මක කර තිබූ නමුත් ඒ අතරින් බොහෝ කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය, ශ්‍රමය හා යන්ත්‍රෝපකරණ ගොවි සංවිධාන ඇතුලු බාහිර පාර්ශව මගින් ලබා ගෙන තිබුණි.

ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය මගිනි. එම එක් එක් කාර්යාල වල පවතින යන්ත්‍ර සූත්‍ර හා මිනිස් ශ්‍රමය භාවිතා කර ඉදිකිරීම් කටයුතු සිදු කරනු ලබන අතර ඒ සඳහා අවශ්‍ය අමතර ශ්‍රමය හා යන්ත්‍රෝපකරණ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කරමින් බාහිර පාර්ශව වෙතින් ලබා ගනු ලැබේ. මෙම නිසා දෙපාර්තමේන්තුව සතු යන්ත්‍රසූත්‍ර හා මිනිස් ශ්‍රමය භාවිත කරන බැවින් කොන්ත්‍රාත්කරුවන් විසින් මෙම කාර්යයන් සිදු කිරීමේදී ගතවන කාලයට වඩා අඩු කාලයකින් හා අඩු පිරිවැයකින් අවශ්‍ය කාර්ය සිදු කර ගත හැක.

## 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කර ඇති වටිනාකම ගණනය කළ නොහැකි වාහන 45 ක් වර්ෂ ගණනාවක සිට බාහිර පාර්ශවයන් වෙත එනම් මහවැලි අධිකාරියට වාහන 11 ක් හා වාරිමාර්ග කළමනාකරණ අංශයට වාහන 34ක් ලබා දී තිබුණු අතර එම වාහන දෙපාර්තමේන්තුව වෙත නැවත ලබා ගැනීමට හෝ අදාල ආයතන වෙත නිත්‍යානුකූලව පවරා දීමට පියවර ගෙන නොතිබුණි. | ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ඉල්ලීම මත වාරිමාර්ග දෙපාර්තමේන්තුව සතු වාහන 11ක් පවරාදීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇති අතර, මෙම වාහන පවරාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන මෙන් ඔවුන් වෙත ලිඛිතව දන්වා ඇත. වූ වාරිමාර්ග කළමනාකරණ අංශයේ රාජකාරී කටයුතු සඳහා ඔවුන්ගේ ඉල්ලීම පරිදි වාහන 34ක් ලබා දීමට කටයුතු කර ඇති අතර, පසුව එම අංශය අමාත්‍යාංශයට අනුයුක්ත වීම නිසා මෙම වාහන "වාරිමාර්ග අමාත්‍යාංශයේ" ලේකම්ගේ නමට පවරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරන මෙන් ඔවුන් වෙත ද ලිඛිතව දන්වා ඇත. | වත්කම් වල සන්තකය පැවරිමට සමගාමීව ඒවායේ නිත්‍යානුකූල අයිතියද පැවරිමට කාලීනව කටයුතු කල යුතුය |

## 3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) තිස්ස වැවේ රොන්මඩ ඉවත් කිරීම.** | | |
| **i.** වාරිමාර්ග අධ්‍යක්ෂ හම්බන්තොට විසින් සි/ස.ගජා හෝල්ඩින් (පුද්ගලික) සමාගම සමග 2021 එකී ගිවිසුමට එළඹ තිබුණි. වැවේ වපසරිය වූ අක්කර 120 න් සියයට 17 ක් අනවසරයෙන් වගා කටයුතු සඳහා යොදාගැනීම, වැව වටේ පිහිටි හෝටල්, නිවාස 50 ක් අනවසරයෙන් භාවිතා කරන බව 2019 හඳුනාගෙන තිබුණ ද ඊට අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම, වැවේ සීමාවන් හඳුනාගැනීමකින් තොරව ආරම්භ කිරීම, | දැනටමත් මෙම රක්ෂිතය තුල අනවසර පදිංචිකරුවන් හඳුනාගෙන ඉන් කොටසක් ඉවත්කර ඇති අතර, අනෙකුත් පුද්ගලයන්ට විරුද්ධව නීතිමය කටයුතු සිදුකිරීමට නියමිතය. | වැව් වල රොන්මඩ ඉවත් කිරිමට තිරණය කිරිම හා රොන් මඩ ඉවත් කරන ආකාරය පිළිබඳව නිර්නායකයන් සකස් කල යුතුය. |

| | | |
|---|---|---|
| වර්ෂ 10 ක කාලයක් තුළ වැව් පතුලෙහි මට්ටම නිර්ණය නොකිරීම, ජල විදුම් අංශයේ පතුලෙහි මට්ටම සඳහා ඉලෙක්ට්‍රෝනික උපකරණ භාවිතයෙන් සිදු කිරීමට ඉල්ලීම සඳහා ක්‍රියාමාර්ග නොගැනීම යන අඩුපාඩු තිබියදී ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. තවද මධ්‍යම පරිසර අධිකාරියෙන් ලබා දී ඇති පාරසරික නිර්දේශ අංක 7.1 වගන්තිය ප්‍රකාරව භූ විද්‍යා සංවර්ධන හා පතල් කාර්යංශයෙන් වෙළඳ බලපත්‍රය ලබාගෙන නොතිබුණි. රොන්මඩ නිස්සාරණය කර ලබාගෙන තිබූ වැලි අලෙවි කිරීමට හැකියාව තිබුණ ද ගිවිසුමේ කොන්දේසි අංක 33 ප්‍රකාරව වාණිජ කටයුත්තක් ලෙස සිදු වූවානම් රාජ්‍ය භාගය අයකුළ යුතු වුවත් එලෙස සිදු කර නොතිබුණි. | | |
| ii යන්ත්‍ර ආධාරයෙන් වැව තුළින් ලබාගන්නා ලද රොන් මඩ කිසිලෙසකින්වත් වැව තුළ සේදීම නොකළ යුතු අතර වැවෙහි හෝ ප්‍රධාන ඇලෙහි ජලය අපවිත්‍ර නොකළ යුතු බව කොන්ත්‍රාත් ගිවිසුමෙහි 10 වගන්තියේ ඇතුලත් වුවද ඊට පටහැනිව තිස්සමහාරාම ප්‍රාදේශීය ඉංජිනේරු විසින් තාවකාලිකව ලබා දී ඇති වැඩ බිම තුළ මෙම ව්‍යාපෘතිය අවසන් වන තෙක් වැලි නිස්සාරණය කිරීම පවත්වාගෙන යාමට එකඟතාවය ලබා දී තිබුණි. | ගිවිසුමේ මෙම වැලි සේදීම වැව තුල නොකලයුතු බව සදහන් වුවත් ප්‍රායෝගිකව වැලි සේදීම සුදුසු ස්ථානයක් සොයා ගැනීමට අපහසු වී ඇත. මෙම ක්‍රියාවලිය සම්බන්ධයෙන් වැවට කිසියම් හානියක් සිදුවී ඇත්දැයි පරීක්ෂා කර බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. | ගිවිසුම් කොන්දේසි ඉක්මවා කටයුතු කිරිමට අවසර ලබා දුන් නිලධාරින් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධි විධාන ප්‍රකාරව කටයුතු කල යුතුය |
| iii කැලෑ ආඥාපනතේ 20 වන වගන්තිය යටතේ 2009 මැයි 06 දිනැති අංක 1600/18 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර ඇති ගාස්තු අනුව, ඉවත් කර ගනු ලබන මතුපිට පස් කියුබ් 01 ක් සඳහා රු.1,120 බැගින් වූ ඉඩම් පරිහරණ ගාස්තුවක් අයකිරීමේ හැකියාවක් පැවතියද එම කොන්දේසිය ගිවිසුමට ඇතුළත් කර නොතිබීම නිසා ව්‍යාපෘති වාර්තා අනුව දිනකට කියුබ් 100 බැගින් මාසිකව ඉවත් කිරීමට අපේක්ෂිත කියුබ් 2400 ක් වෙනුවෙන් අයකර ගත හැකිව තිබූ වටිනාකම රු.2,688,000 ක් විය. ඒ අනුව ගිවිසුම් කාලය වූ මාස 12 ක් තුල රජයට අහිමි වී ඇති මුදල රු. 32,265,000 ක් විය. | මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද්දේ නියමු ව්‍යාපෘතියක් වශයෙනි. මෙම ව්‍යාපෘතිය මගින් වැවතුල තැන්පත් වී ඇති රොන්මඩ ඉවත් කිරිම සිදුකරනු ලබයි. මෙම පස් වන සංරක්ෂණ භූමිය තුල පිහිටා ඇති බැවින් එම පස් ඒ ආකාරයටම ලබා ගෙන ප්‍රයෝජනයට ගත නොහැකි බැවින් හා මෙම රොන්මඩ ඉවත් කිරිම | |

| | | | |
|---|---|---|---|
| | | දෙපාර්තමේන්තුව මගින් සිදුකලේ නම් ඒ සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුවන බවද දන්වමි. ඒ අනුව පස් සඳහා ගාස්තුවක් අයකිරිමට කොන්දේසි වලට ඇතුලත් නොකරන ලදී. | |
| (ආ) | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ වහලයෙන් පිටතට යන වැසි ජලය ඉවත් කිරිම සඳහා සුදුසු ක්‍රමවේද භාවිතා නොකිරිම, කොන්ක්‍රීට් පුවරුව නිසි පරිදි නඩත්තු නොකීරීම හා අවශ්‍ය අලුත්වැඩියාවන් යාවත්කාලීනව සිදු නොකිරීම නිසා 2010 වර්ෂයේ සිට ගොඩනැගිල්ලේ අභ්‍යන්තරයට ජලය කාන්දු වී තිබුණි. එම ජල කාන්දුව නිසා ගොඩනැගිල්ලේ පළමු කොටසේ සියළු මහලයන්හි ඇති අංශ වලට බලපා තිබුණි. ගොඩනැගිල්ලේ සියලු අංශවල පැවති කාර්යාල උපකරණ, පරිගණක පද්ධති, ලිපිගොනු හා පොත්පත් හානිවීම් ඇති වී තිබුණි. | 2020 වර්ෂයට පෙර සිටම වහල මාලයෙහි කොන්ක්‍රීට් පදාස හරහා සිදු වූ ජල කාන්දුවීම් නිසා එම කොටස ආවරණය වන පරිදි වහලයක් ස්ථාපිත කොට එය වටා කාණුවක් හා ජල බස්නා බට සවි කිරිමක් සිදු වී තිබිණි. පසුව 2021 වසරේ මුල් මාසයේ මෙය නැවත සිදුවීම වැළැක්වීමට ගත යුතු මූලික පියවර ලෙස ජල බස්නා බට ප්‍රමාණය වැඩි කිරිමට සහ වහලය වටා ඇති කාණුව ජල නිවාරණය කිරීමට අවශ්‍ය ඇස්තමේන්තු සාදා ජල බස්නා බට සවිකිරීම සඳහා කොන්ත්‍රාත් ලබා දී තිබුණි. ඒ අනුව එම වැඩ කටයුතු වලින් කාණුව ජල නිවාරණ කටයුතු සිදුකර දින 14 ක කාලයක් පරීක්ෂණයකට භාජනය කල යුතුව තිබූ අතර, පරික්ෂණය සිදුකරන අවස්ථාවේ දිනක ඇතිවූ අනපේක්ෂිත හා අධික වර්ෂාව නිසා මෙම ජල කාන්දුව ඇතිවූ නිසා මෙම සිදුවීම කොන්ත්‍රාත්කරු අතින් සිදුවූ නොසැලකිල්ලක් ලෙස සැලකිය නොහැකි බව දන්වමි. | විශේෂිත කාර්යයන් සඳහා සකස් කරනු ලබන ප්‍රසම්පාදන ගිවිසුම් වලට අදාළ කාර්යයේ අධික්ෂණයේ දී වෘත්තීයමය නොසැලකිල්ලක් සිදු වී ඇතිදැයි පරික්ෂණයක් පවත්වා ඒ අනුව කටයුතු කල යුතුය |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය 7.2.1.2 (ආ) I වගන්තිය අනුව III වන ශ්‍රේණියේ සෘජු බඳවා ගැනීම් සඳහා වෘත්තීය සුදුසුකම් ලෙස ගල්ගමුව වාරිමාර්ග අභ්‍යාස ආයතනයෙන් වාරිමාර්ග ඉංජිනේරු ඩිප්ලෝමාව හදාරා සහතිකයක් ලබා තිබීම පිළිගෙන ඇති අතර එම පාඨමාලාව NVQ 6 මට්ටම විය යුතු බව සඳහන් වේ. සේවා ව්‍යවස්ථාව අනුමත කර වර්ෂ 05 ක් ගතවී ඇතත් මේ දක්වා ගල්ගමුව වාරිමාර්ග අභ්‍යාස ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු ඩිප්ලෝමාව සඳහා NVQ 6 මට්ටම අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගල්ගමුව වාරිමාර්ග අභ්‍යාස ආයතනය මගින් පවත්වන වාරිමාර්ග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් NVQ 6 මට්ටම ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇති අතර අවශ්‍ය අනෙකුත් ඇගයීම් කටයුතු සඳහා පාඨමාලාව හදාරන කණ්ඩායමක් ආයතනය තුළ පැවතීම මූලික අවශ්‍යතාවක් බව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව දන්වා ඇත. එහෙත් ඉංජිනේරු සහකාර බඳවා ගැනීම තාවකාලිව අත්හිටුවා ඇති බැවින් පාඨමාලාව සඳහා අදාල එකී NVQ 6 මට්ටම ලබා ගැනීමට නොහැකි වී ඇත. | NVQ 6 මට්ටම අනුමත කර ගත යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

---------------------------------

### 4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති 26 ක් වෙත විශාල ඉදිකිරීම් අංශය මගින් කාර්ය මණ්ඩලය අනුයුක්ත කිරීම අනුමත කර තිබුණු අතර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් එම තනතුර අනුමත කර ගෙන නොතිබුණි. වර්ෂ 1- 5 දක්වා වැඩ බැලීමේ පදනම යටතේ සේවකයින් 13 දෙනෙකු අනුයුක්ත කිරීම් කර තිබුණි. | වර්තමාන රජය ව්‍යාපෘතිවල වියදම් කළමනාරකණය සඳහා ව්‍යාපෘති කළමනාරකරණ ඒකක පිහිටුවීමෙන් තොරව දෙපාර්තමේන්තුවේ නිළධාරීන් හැකි පමණ යොදවා ව්‍යාපෘති ආරම්භ කරන ලෙස ලබා දුන් උපදෙස් අනුව සියළු ව්‍යාපෘති වෙනුවෙන් එක් කළමනාකරණ ඒකකයක් සහ දෙපාර්තමේන්තුවේ දැනට පළපුරුදු නිළධාරීන් නොමැති තනතුරු පමණක් පිටින් බඳවා ගැනීමට ද අනෙක් සියළු තනතුරු වාරිමාර්ග දෙපාර්තමේන්තු නිළධාරීන්ගෙන් සම්පූර්ණ කර ව්‍යාපෘති ආරම්භ කිරීමට ලබා දෙන ලද උපදෙස් අනුව කටයුතු කරන ලදී. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් එම තනතුර අනුමත කර ගැනීමට කටයුතු කළයුතුය |